N-

# රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

## භාවිතයෙන් ඉවත් කරනු ලැබූ වාහන විකිණීම සඳහා මිල ගණන් කැඳවීම

රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ භාවිතයෙන් ඉවත් කරනු ලැබ ඇති පහත සඳහන් වාහන විකිණීම සඳහා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන කමිටු සභාපති විසින්, මුද්‍රා තබන ලද මිල ගණන් කැඳවනු ලැබේ.

| අනු අංකය | ලියාපදිංචි අංකය | වාහන වර්ගය | ඉන්ධන වර්ගය | නිෂ්පාදිත වර්ෂය | විකුණනු ලබන ක්‍රමවේදය |
|---|---|---|---|---|---|
| 1 | 17-8233 | Motor Tricycle | පෙට්‍රල් | 1990 | වාහනයක් ලෙස |
| 2 | WPGU-9922 | Motor Bicycle | පෙට්‍රල් | 2002 | වාහනයක් ලෙස |
| 3 | 56-9708 | Dual Purpose Vehicle (Double Cab) | ඩීසල් | 1995 | වාහනයක් ලෙස |
| 4 | 56-9718 | Dual Purpose Vehicle (Double Cab) | ඩීසල් | 1995 | ගර්හිත කොට අබලි ද්‍රව්‍ය ලෙස |
| 5 | 17-6596 | Motor Car | පෙට්‍රල් | 1990 | ගර්හිත කොට අබලි ද්‍රව්‍ය ලෙස |

ඉහත වාහන 2021/10/14 දින සිට 2021/11/03 දින දක්වා සතියේ රාජකාරි දිනයන්හි පෙ.ව. 9.00 සිට ප.ව. 4.00 දක්වා කාලය තුළ කොළඹ 08, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවතේ අංක 118 දරන ස්ථානයේ පිහිටි රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තු පරිශ්‍රයේ දී පරීක්ෂා කර බැලිය හැක.

එක් එක් වාහනය සඳහා මිල ගණන් ඉදිරිපත් කිරීමට අදාළව අයදුම්පත් 2021/10/14 දින සිට 2021/11/03 දින දක්වා රාජකාරි දිනයන්හි පෙ.ව. 9.00 සිට ප.ව.3.00 දක්වා කාලය තුළ දී එක් අයදුම්පතකට රු.1000.00 ක් බැගින් ආපසු නොගෙවන ගාස්තුවක් ගෙවීමෙන් රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ ප්‍රවාහන අංශය වෙතින් ලබා ගත හැකි වේ. සැ.යු. - එක් අයදුම්පතක් මගින් මිල ගණන් ඉදිරිපත් කළ හැක්කේ එක් වාහනයක් සඳහා පමණි.

නිසි පරිදි සම්පූර්ණ කර මුද්‍රා තැබූ අයදුම්පත් "මුල් පිටපත" සහ "අනු පිටපත" ලෙස පිටපත් 02 කින් යුක්තව සකස් කර එම පිටපත් දෙක එක් කවරයක බහා මුද්‍රා තබා ඉදිරිපත් කළ යුතු වේ. මිල ගණන් ඉදිරිපත් කරනු ලබන වාහනයට අදාළව එම කවරයේ ඉහළ වම් කෙළවරෙහි "රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ භාවිතයෙන් ඉවත් කළ වාහන මිලදී ගැනීම - වාහන අංකය ......................" යනුවෙන් සඳහන් කළ යුතු ය.

ඉහත එක් එක් ලංසුව වෙනුවෙන් තැන්පත් කළ යුතු ලංසු බැඳුම්කරයේ වටිනාකම පහත පරිදි වන අතර එම ලංසු බැඳුම්කරය මුදලින් රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව වෙත තැන්පත් කර අදාළ **කුවිතාන්සියේ මුල් පිටපත** නියමිත ලංසුවේ මුල් පිටපත සමඟ අමුණා ඉදිරිපත් කළ යුතු ය.

| වාහන අංකය | වාහන වර්ගය | ආපසු ගෙවන ලංසු බැඳුම්කරයේ වටිනාකම රු. |
|---|---|---|
| 17-8233 | Motor Tricycle | 1000.00 |
| WPGU-9922 | Motor Bicycle | 1000.00 |
| 56-9708 | Dual Purpose Vehicle (Double Cab) | 7000.00 |
| 56-9718 | Dual Purpose Vehicle (Double Cab) | 2000.00 |
| 17-6596 | Motor Car | 1000.00 |

සියලුම අයදුම්පත් 2021/11/05 දින ප.ව. 2.00 ට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මඟින් එවීම හෝ දෙපාර්තමේන්තුවේ ප්‍රවාහන අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම හෝ කළ හැකි ය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කෙරේ.2021/11/05 දින ප.ව. 2.00 ට ලංසු විවෘත කරනු ලැබේ. ලංසු විවෘත කරනු ලබන අවස්ථාව සඳහා ලංසුකරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට සහභාගි විය හැක.

ඉහත කාර්යයන් සම්බන්ධව වැඩි විස්තර සතියේ රාජකාරී දිනයන් හි පෙ.ව. 8.30 සිට ප.ව. 4.15 දක්වා දූරකථන අංක 011-2694657 පරිපාලන නිලධාරි ඇමතීම මඟින් ලබා ගත හැක.

ගංගානි ලියනගේ.
සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව

රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
අංක 118, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත,
කොළඹ 08.
2021/10/14

ෆැක්ස් - 011 2698653
වෙබ් අඩවිය - www.documents.gov.lk